පන්තිය: 13

විෂය: ජීව විද්‍යාව

සතිය: නොවැම්බර් 01-07

1.ඒකකය : ප්‍රවේණිය

2.ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:

- මෙම පාඩමට අදාළව ඊ නැණ පියස , ඊ තාක්ෂලාව වෙබ් සයිට් වලට පිවිස වැඩිදුර හැදෑරීම් කරන්න.
- ඒවායේ ඇතුලත් ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- සම්පත් පොත (ප්‍රවේණිය) අධ්‍යයනය කරන්න

3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි ඉගෙනුම් ආධාරක

ඊ නැණ පියස

https://www.enenapiyasa.lk/lms/course/view.php?id=552

ඊ තක්ෂලාව

https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=447#section-6

https://youtu.be/k-8nsipSziA

https://youtu.be/MMMvWvjPfnM

https://youtu.be/T5d5G2vmdyw

4.ඉගෙනුම් ඵල

ජාන ප්‍රතිබද්ධයේ රූපානුදර්ශ අනුපාතය *Drosophila* ගේ ඇසේ වර්ණය හා පිහාටු වර්ණය උපයෝගි කර ගනිමින් පැහැදිලි කර විශ්ලේෂණය කරයි.
• මානව ලිංග නිර්ණය විස්තර කරයි.
• හිමෝෆිලියාව සහ වර්ණ අන්ධතාව මානව ලිංග ප්‍රතිබද්ධ ලක්ෂණයක් ලෙස ප්‍රකාශ කරයි.
• මානව ලිංග ප්‍රතිබද්ධ ප්‍රවේණිය පැහැදිලි කර විශ්ලේෂණය කරයි.
• තනි ජානයක් මගින් බලපෑම් රාශියක් ඇති වීම, බහුකාර්යතා ප්‍රවේණිය ලෙස අර්ථ දක්වයි. (උදාහරණ ලෙසඃ මිනිසා තුළ ඇති වන සිස්ටික් ෆයිබ්‍රෝසියාව සහ දෑකැති සෛල රක්තහීනතාව)
• අපිජාන ප්‍රවේණි සංකල්පය නියුක්ලියෝටයිඩ අනුපිළිවෙළ සම්බන්ධ නොවන යන්ත්‍රණයක් මගින් සම්ප්‍රේෂණය වන බව දළ සැකැස්මකින් දක්වයි. (උදාඃ- සම නිවුන් දරුවන්ගේ එක් අයකුට පමණක් භීනෝන්මාදය රෝගය ඇති වීම)
• ගහනයක් තුළ ප්‍රභේදන ඇති වීමට මෙන්ඩලීය නොවන ලක්ෂණ දායක වන ආකාරය අගය කරයි. හාඩි-වයින්බර්ග් සමතුලිතතාව විස්තර කරයි.
• හාඩි-වයින්බර්ග් සමතුලිතතාවය පැවතීම. සඳහා තත්ත්ව ප්‍රකාශ කරයි.
• ජාන සංඛ්‍යානයේ වෙනස් වීම් පරිණාමයට හේතු වන ආකාරය විස්තර කරයි. ශාක හා සත්ත්ව අභිජනනයේ වැදගත්කම උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරයි.
• ශාක හා සත්ත්ව අභිජනනයේ යොදා ගන්නා ක්‍රම කීපයක් කෙටියෙන් පැහැදිලි කරයි.
• මුහුම් ක්‍රම ශිල්පවල ප්‍රවේණික මූලධර්ම කෙටියෙන් පැහැදිලි කරයි.
• ස්වාභාවික හා කෘත්‍රිම අභිජනන ක්‍රමවල වාසි හා අවාසි සංසන්දනය කරයි.
• වැඩිදියුණු කළ ප්‍රභේදන ලබා ගැනීම සඳහා ශාක හා සත්ත්ව අභිජනන ශිල්පීය ක්‍රමවල වටිනාකම අගය කරයි